# 3

# නබිවරු සහ රසූල්වරු




අල්ලාහ්ගෙන් වහී ලැබූ අය නබිවරු යැයි හඳුන්වනු ලබති. නබිවරුන් අතර සුවිශේෂ වූ අය රසූල්වරු ලෙස සලකනු ලබති. මොවුහු අල්ලාහ්ගෙන් ආගම් ලැබූ අය වෙති. මෙසේ අල්ලාහ් මෙලොවට නබිවරුන් එක්ලක්ෂ විසි හතර දහසක් දෙනා පහළ කළේ ය. ඔවුන්ගෙන් තුන්සිය දහතුන් දෙනෙක් රසූල්වරු වූහ.




අල් කුර්ආනයේ නබිවරු විසිපස් දෙනකුගේ නම් සඳහන් වේ. ඔවුහු සියල්ලෝ ම රසූල්වරුන් ද වෙති. රසූල්වරුන්ගෙන් නූහ් අලෛහිස්සලාම්, ඉබ්රාහීම් අලෛහිස්සලාම්, මූසා අලෛහිස්සලාම්, ඊසා අලෛහිස්සලාම් සහ මුහම්මදු සල්ලල්ලාහු අලෛහි වසල්ලම් **"උලුල් අස්ම්"** දැඩි ස්ථාවරත්වයක් ඇති අය වශයෙන් හඳුන්වනු ලබති.

රසූල්වරුන්ගෙන් සමහරු අල්ලාහුගේ මගපෙන්වීම සුහුෆ් වශයෙන් ද, තවත් සමහරු ආගම් වශයෙන් ද ලදහ. නබි මූසා අලෛහිස්සලාම් තුමා ආගම් සහ සුහුෆ් යන දෙවර්ගය ම ලැබූ රසූල්වරයා ය. අල් කුර්ආනයේ සඳහන් කර ඇත්තේ ආගම් ලද රසූල්වරුන් හතර දෙනකුගේ නම් ය.

| ලැබූ ආගම් | ආගම් ලැබූ නබිවරු | එහි භාෂාව |
|---|---|---|
| තව්රාත් | මූසා අලයිහිස්සලාම් | අබරානි (හීබ්රූ) |
| සබූර් | දාවූද් අලයිහිස්සලාම් | යූනානි (ග්‍රීක) |
| ඉන්ජීල් | ඊසා අලයිහිස්සලාම් | සුර්යානි (සූර්ය) |
| ෆුර්කාන් | මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් | අරාබි |

නබිවරු සියලුදෙනා මිනිස්සු වෙති. ඔවුන් සතුව ආදරය, සත්‍යය, යුක්තිය, අවංකත්වය, කැපවීම, පිරිසිදුකම, අන් අයගේ යහපත් සුරැකීම, විශ්වාසවන්ත භාවය රැකීම, බුද්ධිමත්කම, පරිත්‍යාගශීලිත්වය වැනි උතුම් ගුණාංග පූර්ණ වශයෙන් දැකගත හැකි විය. තව ද ජනතාවට ඔවුන් නබිවරු යැයි හඳුනා ගැනීම සඳහා අල්ලාහ් ඔවුනට මුඃජිසාත් (ප්‍රාතිහාර්ය) ද ලබා දී තිබුණි. ඔවුහු එමගින් තමන් නබිවරයකු බව ඔප්පු කර පෙන්වා අල්ලාහ්ගේ මාර්ගයට ජනයා කැඳවූහ.

**නබිවරුන් කිහිපදෙනෙකු සහ ඔවුනට ලබා දී තිබූ මුඃජිසාත්යන්.**

1. මූසා අලෛහිස්සලාම් . හැරමිටිය සර්පයකු වීම, අත දිලිසීම.
2. දවූද් අලෛහිස්සලාම් . යකඩ මෙලෙක් කරනු ලැබීම.
3. සුලයිමාන් අලෛහිස්සලාම් .ජින්වරුන් සුළඟ යනාදිය වසඟ කරනු ලැබීම, අනෙකුත් ජීවීන්ගේ බස තේරුම් ගත හැකිවීම.
4. ඊසා අලෛහිස්සලාම් . මළ අය පණ දී නැගිටුවීම, උපතින් ම අන්ධ අය සහ කුෂ්ඨ රෝගීන් වැනි අය සුවපත් කිරීම, නිවෙස්වල ඇති සැඟවුණු දේ ගැන කීම.
5. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් . අල් කුර්ආනය

මෙලොව බිහි වූ සියලු ප්‍රජා සමූහය යහමග යැවීම සඳහා අල්ලාහ් නබිවරුන් එවා ඇත. කියාමාවේ දී මිනිසුන් ප්‍රශ්න කරනු ලබන අවස්ථාවේ දී සෑම ජන කොට්ඨාසයක් ම අල්ලාහ් ඉදිරියේ පෙනී සිටිනුයේ තමන්ට එවනු ලැබූ නබිවරයා සමග ය. සෑම නබිවරයෙක් ම තම උම්මත්වරුන් පිළිබඳ ව අල්ලාහ් වෙත සාක්ෂි දරන්නෙක් වේ.

නබිවරු අල්ලාහ්ගේ ආගම සිත්ගන්නා ආකාරයට, තම ජනයාට ප්‍රචාරය කළ විට ඉතා දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. සමහරු ඔවුන්ගේ දේශනා පිළිගත්හ. තවත් සමහරු ඊට විරුද්ධ වූහ.

ඔවුහු එම නබිවරුන් තම ගම්බිම්වලින් පළවා දැමූහ. ඔවුන් ඝාතනය කිරීමට වෙහෙසුණහ. සකරියියා අලෛහිස්සලාම්, යහ්යා අලෛහිස්සලාම් යන නබිවරු ඝාතනය කරන ලදහ. නබිවරු තමන්ට එරෙහිව පැමිණි සියලු අභියෝගවලට ඉවසීමෙන් හා දැඩි අධිෂ්ඨානයෙන් යුතුව මුහුණ දුන්හ.

නබිවරුන් නොසලකා හරිමින් තමන්ගේ හිතුමතයට ජීවත් වූ ප්‍රජාවෝ විවිධ ආකාරයෙන් විනාශ කරනු ලැබූහ. නූහ් අලෛහිස්සලාම් තුමාගේ සමාජය ජල ගැලීමෙන් ද ගංවතුරෙන් ද, හූද් අලෛහිස්සලාම් තුමාගේ සමාජය (ආද්) සුළඟ මගින් ද, සාලිහ් අලෛහිස්සලාම් තුමාගේ ප්‍රජාව (සමූද්) හෙණ හඬින් ද, ලූත් අලෛහිස්සලාම් තුමාගේ ප්‍රජාව ගල් වර්ෂාවක් මගින් ද විනාශ කරනු ලැබූ බව අල් කුර්ආනය සඳහන් කරයි.

මෙලොවට පහළ කරනු ලැබූ නබිවරු සියලු දෙනා ඉස්ලාම් යන අල්ලාහ්ගේ දහම ගොඩ නැඟීමේ කාර්යයෙහි යෙදුණහ. එය ආරම්භ කළේ ආදම් අලයිහිස්සලාම් තුමා ය. අවසන් කළේ මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ය. එනිසා අල්ලාහ් මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා **"(kh)කාතමුන් නබියියීන්"** අවසාන නබිවරයා යැයි ද, **"රහ්මතුන් ලිල් ආලමීන්"** "ලෝවැසියන්ට දයාදයක් " යැයි ද සඳහන් කරයි.

මෙලොවට යවනු ලැබූ සියලු නබිවරු මරණයට පත්වූහ. ඊට පටහැනි ලෙස ඊසා අලෛහිස්සලාම් තුමා පමණක් නැවත අහසට ඔසවා ගනු ලැබූහ. "ඊසා අලෛහිස්සලාම් තුමා නැවත මෙලොවට පැමිණ මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සම්පූර්ණ කළ ඉස්ලාම් ආගම මුළු ලොවෙහි ම ක්‍රියාවට නංවා සම්පත් සහ සාමයෙන් පිරිපුන් රාජ්‍යයක් බිහි කරයි" යන්න කියාමාවේ ලක්ෂණවලින් එකකි.

සමහර නබිවරු සහ ඔවුන්ට අයත් සුවිශේෂ නාමයන්.

| නබිවරයාගේ නම | සුවිශේෂ නාමය | තේරුම |
|---|---|---|
| ආදම් අලෛහිස්සලාම් | අබුල් බෂර් | මිනිසුන්ගේ පියා |
| ඉබ්රාහීම් අලෛහිස්සලාම් | කලීලුල්ලාහ් | අල්ලාහ්ගේ මිතුරා |
| මූසා අලෛහිස්සලාම් | කලීමුල්ලාහ් | අල්ලාහ් සමඟ කතා කළ තැනැත්තා |
| ඊසා අලෛහිස්සලාම් | රූහුල්ලාහ් | අල්ලාහ්ගේ ප්‍රාණය |

**නබිවරුන් සියලු දෙනා එක සේ විශ්වාස කිරීමත් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මුළුමනින් ම අනුගමනය කිරීමත් අපගේ යුතුකම වන්නේ ය.**

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

أُولُو الْعَزْمِ    أَبُو الْبَشَرِ    كَلِيْمُ اللهِ    رُوْحُ اللهِ    خَاتَمُ النَّبِيِّيْنَ    الْمُعْجِزَاتُ    الصُحُفُ

وَحْيٌ    الرَسُوْلُ    النَبِيُّ    خَلِيْلُ اللهِ    رَحْمَةٌ لِلْعَالَمِيْنَ

**අභ්‍යාස**

01. පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න
   1. "උලුල් අස්මි" යැයි හඳුන්වන නබිවරු කවරහු ද?
   2. නබිවරුන් තුළ දක්නට ලැබෙන උතුම් ගුණාංග කිහිපයක් සඳහන් කරන්න.
   3. අහසට ඔසවනු ලැබූ නබිවරයාගේ නම සඳහන් කරන්න.
   4. ජනයා විසින් ඝාතනය නරනු ලැබූ නබිවරුන් දෙදෙනාගේ නම් ලියන්න.

02. ගළපා යා කරන්න.

| (අ) | (ආ) |
| --- | --- |
| නූහ් අලෛහිස්සලාම් | සුර්යානි භාෂාව |
| මූසා අලෛහිස්සලාම් | අල් කුර්ආන් |
| නබි මුහම්මද් සල්ලලාහු අලෛහි වසල්ලම් | නැව |
| සුලයිමාන් අලෛහිස්සලාම් | බනූ ඉස්රාඊල්වරු |
| ඊසා අලෛහිස්සලාම් | ජින්වරු |